# [09]
# ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය

ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. නුවන්ගී රංගධාරා විජයරත්න, එස්. ඒ. උත්පලා පවිත්‍රා සෙනෙවිරත්න,
සුවිමාලි වෙත්තසිංහ,ඒ. සි. කල්පනී ජයසිංහ

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුන් වන ලෝකයේ රටක් ලෙසම සාම්ප්‍රදායික චින්තනයෙන් යුත් කළමනාකරණ පරිචයක් හිමි රටක් ය. තවමත් ලෝක ආර්ථිකය හමුවේ සංවර්ධනය වෙමින් පවතින රටකි. මේ සඳහා විවිධ සාධක බලපානු ලබන අතර ශ්‍රමික දායකත්වය සහ ඵලදායිතාවය ඒ සඳහා ප්‍රබල හේතුවක් වේ. ශ්‍රම දායකත්වය සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම දායකත්වය සඳහා කාන්තා නියෝජනය ඉතා සීමිතව පැවති යුගයක් පැවතින. නමුත් වර්තමානයේ එය වෙනස් වෙමින් පවතී. මෙම ලිපියෙන් ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කරයි.

## ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. එම නිසා එහි පවතින්නා වූ ආර්ථික වර්ධනය පහළ මට්ටමක පවතී, පසුගිය කාලය තුළ මෙම තත්ත්වය සඳහා වස්තු බීජය වූයේ යුද්ධයයි. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයෙන් ආරම්භ වූ මෙම යුධමය තත්ත්වය පසුකාලීන ව දිවයිනේ දකුණු ප්‍රදේශය කරා ව්‍යාප්ත විය. වර්ෂ 1983 සිට 1996 දක්වා යුද්ධය සඳහා වැය වූ වියදම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය මෙන් දෙගුණයකි (Arunatilake 2001; Tudawe, 2003; Kelegama, 2004). මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමාජයීය, ආර්ථිකමය හා දේශපාලනිකය පිරිහීමක් ඇති විය. ආර්ථික වර්ධන වේගය සීඝ්‍රයෙන් පසුබෑමට ලක් වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය හා ශ්‍රම බලකායේ දායකත්වය කෙරෙහි කාන්තා නියෝජනය වර්ධනය කිරීමේ ආභිලාෂයෙන් නව සමාජ හා සුබ සාධන ප්‍රතිපත්තීන් සකස් කිරීමට ශ්‍රී ලංකා රජය උත්සුක විය.

යුද්ධයට පෙර ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය ජාතික ප්‍රතිපත්ති මගින් සීමා කර තිබුණි (Women and governance Sri Lanka, 2003). දෙමළ හා මුස්ලිම් කාන්තාවන් ගෘහ කටයුතු හා නිවස තුළ ස්වයං රැකියා සඳහා සීමා කිරීමට ඔවුන්ගේ සංස්කෘතික සිරිත් විරිත් බලපෑම් එල්ල කළහ. කෙසේ වෙතත් ආර්ථික පරිසරය තුළ සිදු වූ වෙනස්කම්, ආර්ථික පසුබෑම් හා යුධමය ආතතිය සමඟ බැඳුනු දරිද්‍රතාවය ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය වර්ධනය කිරීමට රුකුලක් විය.

මුල් අවධියේදී කාන්තා ශ්‍රම බලකාය අ.පො.ස. උසස් පෙළ සමත් වූවන් 50%ක ගෙන්ද, 5 ශ්‍රේණිය සමත් වුවන් 17%කින්ද ඉතිරිය පහළ අධ්‍යාපන මට්ටමකින් ද සමන්විත විය (Sri Lanka department of census and statistics, 2002). මෙම සංයුතිය පුරුෂ පක්ෂයට සාපේක්ෂව පහළ මට්ටමකි. බොහෝ කාන්තාවන් සේවයක නියුතු වුවද ඔවුන් වැටුපක් නොලැබූහ. එමෙන් ම මෙම වකවානුව තුළ කාන්තා විරැකියා ආනුපාතය පුරුෂ විරැකියා අනුපාතය මෙන් දෙගුණයකි. කාන්තාවන් පළමු ව කෘෂිකාර්මික අංශයේ රැකියාවන්හි නියුක්ත විය.

ජාතික ප්‍රතිපත්තීන් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් සකස් කිරීම හේතුවෙන් කාන්තාවන්ගේ අධ්‍යාපනය සහ කුසලතා මට්ටම වර්ධනය විය. වර්තමානයේ කාන්තාවන්ගේ භූමිකාව හා දායකත්වය අතීතයට සාපේක්ෂ ව වෙනස් වෙමින් පවතී (Pounder, 2002). කාන්තාවන්ගේ සමාජ භූමිකාව හා දායකත්වය වෙනස් වීම සඳහා විවිධ සාධක බලපා ඇත. මෙම සාධක අතර අධ්‍යාපනය ප්‍රධාන සාධකයකි. දැනුමෙන් පරිපූර්ණ කාන්තාවන් බිහි වනවාත් සමඟ ම කාන්තාවන් සඳහා වූ රැකියා ඉල්ලුම වැඩි විය. ගෘහ කටයුතු හා කෘෂිකර්මය සඳහා වැඩි නැඹුරුවක් දක් වූ කාන්තාවන් වෙනත් ක්ෂේත්‍ර වල නියැලීමට ද උත්සුක විය. කල්යත්ම කාන්තාවන් විධායක ශ්‍රේණියේ, දේශපාලන ක්ෂේත්‍රයේ ආදී වූ රැකියා සඳහාද යොමු විය.

උතුරු හා නැගෙනහිර මෙන් ම රටේ සියලු ප්‍රදේශ වල කාන්තාවන්ගේ වැටුප පුරුෂයන්ගේ වැටුපට වඩා විශාල වශයෙන් අඩුය (Sri Lanka NEP 2003). ග්‍රාමීය ආර්ථිකය වර්ධනය නොවීමත්, ශ්‍රම සැපයුමට සාපේක්ෂ ව කාන්තාවගේ රැකියා ඉල්ලුම වැඩි වීමත්, මෙසේ වැටුප් අඩුවීමට හේතු වේ. තවද කාන්තාවන්ගේ නිශ්පාදිතවල ප්‍රමාණය අඩු වීමත්, ඔවුන් වැඩෙහි නිරත කාලය අඩුවීමත්, ඔවුන්ගේ වැටුප් අඩු වීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ වවුනියා දිස්ත්‍රික්කයේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නියතු කාන්තාවගේ දෛනික වැටුප දළ වශයෙන් රුපියල් 80ක් හෝ රුපියල් 100ත් අතර වන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියතු පුරුෂයකුගේ දෛනික වැටුප දළ වශයෙන් රුපියල් 200කි.

මුහුදු බඩ ප්‍රදේශයන් හි ජීවත් වන කාන්තාවන්ගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස මසුන් වියලා කරවල සෑදීම, උම්බලකඩ නිපදවීම ආදිය දැක ගත හැක. තවත් සමහර කාන්තාවන් රැකියාවන් සොයා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම ද දැකිය හැක. කෙසේ නමුත් මේ සියලුම කාර්යයන් වලදී කාන්තාවට ලැබෙනුයේ පිරිමින් එම කාර්යයන් සඳහා ලබන වැටුපෙන් අඩකට ආසන්න ප්‍රමාණයකි.

යුද්ධය පැවති ප්‍රදේශ වල නිපදවන ලද කෘෂිකාර්මික නිෂ්පාදන වෙළෙඳපොල කරා ගෙන යාම බොහෝ විට සිදු කරනු ලැබුයේ කාන්තාවන් විසිනි. එයට හේතු වූයේ කාන්තාවන්ට පරීක්ෂණ ස්ථානයන්ගෙන් පහසුවෙන් ගැලවීමට හැකි වූ හෙයිනි. තවද, පිටි වලින් නිපදවන විවිධ ආහාර ද්‍රව්‍ය හා අත්කම් ආදිය නිෂ්පාදනයකර අලෙවි කිරීමද මොවුන් විසින් බහුල ව සිදු කරනු ලැබේ.

යුද්ධය පැවති කාලයන් වල දී එම ප්‍රදේශ වල කාන්තාවන් බොහෝ විට ආර්ථික කටයුතු වල නියැලුණි. එයට හේතු වූයේ පිරිමි පාර්ශවය යුද්ධය සඳහා බඳවා ගැනීම හා තවත් සමහරු යුද්ධය නිසා මිය යෑම හේතුවෙනි. යාපනය ප්‍රදේශයේ වාසයකරන කාන්තාවන් සිමෙන්ති ගඩොල් කැඩීම සඳහා විශේෂ දක්ෂතාවයන් පෙන්නුම් කරයි. එමෙන්ම මඩකලපුව වැනි ප්‍රදේශවල කාන්තාවන් මැහුම් කටයුතු සඳහා විශේෂ දක්ෂතාවයක් පෙන්නුම් කරයි. ඔවුන් එම පාරම්පරික රැකියාවන් වල යෙදීම ද බහුල වශයෙන් දක්නට ලැබේ.

ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත්වන මුස්ලිම් කාන්තාවන් අනෙකුත් අය මෙන් ක්‍රියාශීලිව ආර්ථික කටයුතු වල යෙදීමක් දක්නට නොලැබේ. ඔවුන් ඉතා කලාතුරකින් කෘෂිකාර්මික කටයුතු වල යෙදෙනු දක්නට ලැබේ. නමුත් වැඩි දෙනෙක් තම ස්වාමි පුරුෂයාගේ රැකියාව මත යැපෙනු දැක ගත හැකිය. අතීතයේ ශ්‍රී ලංකාවේ කාන්තාව ගෘහයේ මූලිකයා වීමත්, ඒ මත සමස්ත ගෘහ කළමනාකරණ වගකීම ඇය සතු වීමත් නිසා සමාජ සංවර්ධනයෙහි ලා ඇයගේ දායකත්වය ඉතා වැදගත් වන ලදි. විශේෂයෙන්ම ගෘහ කළමනාකරණය යටතේ ගැනෙන ගෘහයේ භෞතික සම්පත් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය සම්පත් කළමනාකරණය, මෙහෙයුම් කළමනාකරණය හා නඩත්තු කළමනාකරණයේ වගකීම ආදිය ඇයට හිමි වූ වගකීම් වේ. එම නිසා එකල සමාජයේ කාන්තාව නිල ගෘහ මූලිකයා නොවුවත් ගෘහයේ මූලිකත්වය දැරූ බව පෙනී යයි (Kottawatta, 2010).

ග්‍රාමීයව ජීවත් වන සිංහල කාන්තාවන් දිවිපෙවත ගතකරනුයේ වගා කිරීම, කුකුළන් බලා ගැනීම, එළුවන් ඇති කිරීම හා වෙළෙඳාම ආදී කාර්යයන් කිරීමෙනි. ග්‍රාමීය කාන්තාවන් වැඩිදෙනෙක් ගොවි පවුල් වලින් පැවත එන අය හෙයින් වගා කිරීමේ හැකියාව ඔවුන් හට සහජයෙන් ම ලැබී ඇත. ඔවුන් විවාහයෙන් පසුව ද මෙම කාර්යයන් දිගින් දිගටම කරගෙන යති. පවුලට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම ඔවුන් තමන් විසින් ම සිදු කර ගන්නා ලදි.

කාලයත් සමඟ කාන්තාවන් අධ්‍යාපනයෙන් මෙන් ම අත්දැකීම් සම්බන්ධයෙන්ද පරිපූර්ණත්වයට පත් විය. ශ්‍රී ලංකාවේ තුළ පමණක් සේවයේ නියුතු වූ කාන්තාවන් ශ්‍රී ලංකාවෙන් බැහැරව විදේශ රැකියා සඳහා යොමු විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය මේ සඳහා අත්වැලක් සැපයූ ආයතනයකි. විදේශ සේවා නියුක්තිය සඳහා

කාන්තාවන්ගේ දායකත්වය වැඩි කිරීම පිණිස එම අමාත්‍යාංශය පහත ක්‍රියාමාර්ග දියත් කළහ (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව, 2007).
විදේශ රැකියා අවස්ථා වර්ධනය කිරීම.

- රැකියා ඒජන්සි ආයතනය සංවර්ධනය.
- සුබසාධනය හා ආරක්ෂාව.
- රක්ෂණ ක්‍රම.
- පුහුණු පහසුකම් වර්ධනය කිරීම.
- ණය යෝජනා ක්‍රම,

මුලාරම්භයේ පැවති කාන්තා නියෝජත්වයට වඩා වර්තමානය වන විට ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය වර්ධනය වෙමින් පවතී. වර්තමානයේ ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 33.7% (Quarteiy labour force survey, 2007). අධ්‍යාපනයෙන් ඉහළ මට්ටමකට පැමිණ සිටින කාන්තාවන් විධායක ශ්‍රේණියේ, දේශපාලනික ආංශයේ හා රටේ තීරණ ගැනීමේ ක්‍රියාදාමය තුළ ද වැදගත් ස්ථානයක් හිමි වී ඇත. දැනට ශ්‍රී ලංකාවේ විධායක හා ව්‍යවස්ථාපිත අංශයේ රැකියා වල කාන්තා නියෝජනය 21%කි. නමුත් සම්ප්‍රදායික සිරිත්, සමාජ පසුබිම හා පවුල් පසුබිම හේතුවෙන් රැකියාවක නිරත නොවන කාන්තාවන්ද සිටී. ශ්‍රී ලංකාව තුළ කාන්තා විරැකියා ප්‍රතිශතය 15%කි (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2008).

වර්තමානය වන විට පුරුෂ පාර්ශවයට සමගාමීව කාන්තා පාර්ශවය ද සේවා නියුක්තියට විශාල වශයෙන් සක්‍රීය ව දායක වේ. වර්තමානයේ ජීවන වියදම ඉහළ යාමත් සමඟම, පවුලක ආර්ථික මට්ටම ස්ථාවර කර ගැනීම කෙරෙහි කාන්තාවකගෙන් ලැබෙනුයේ නොමසුරු දායකත්වයකි.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ කාන්තාවන්ගේ සහභාගිත්වය වර්ධනය කරලීමට පහත යෝජනා ඉදිරිපත් කළ හැක.

- කාන්තාවන් සඳහා සුදුසු ස්වයං රැකියා හඳුන්වා දීම, ණය පහසුකම් ලබාදීම හා වෙළෙඳපල පහසුකම් ලබාදීම.
- කාන්තාවන්ට රැකියා කටයුතු පහසුවෙන් කරගෙනයාම සඳහා අවශ්‍ය පහසුකම් හඳුන්වා දීම (දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලබා දීම, ක්ෂණික ආහාර වර්ග හඳුන්වා දීම, ප්‍රවාහන පහසුකම්).
- කාන්තාවන්ට රැකියා කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය, පෝෂණය ලබාදීම.
- නව සමාජ හා සුබසාධන ප්‍රතිපත්ති මගින් කාන්තාවන්ට සේවයේ නියුතු වීමට බලපෑම් කරන අහිතකර සීමාවන් ඉවත් කිරීම.
- ''කාන්තාවන් නිවසේ වැඩ කටයුතු වලට පමණක් සීමා විය යුතු යැයි'' යන ආකල්පය වෙනස් කිරීමට අවශ්‍ය වැඩසටහන් සකස් කිරීම.
- රටේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම.
- සේවයෙහි නිරත වීමේදී කාන්තාවන් මුහුණ පාන ගැටලු නිරාකරණය කිරීමට සහය වන්නා වූ කාන්තා සමිති පිහිටු වීම.
- කාන්තාවන්ට අදාල වන රැකියා ව්‍යවස්ථාවන් කාලානුරූපීව සංශෝධනය කිරීම.
- කාන්තාවන්ට රැකියාව සඳහා සාධාරණ වැටුප් ලබාදිය යුතු විම.

**නිගමනය**

සංවර්ධනය සහ අධ්‍යාපනය හමුවේ කාන්තාවන්ගේ භූමිකාවන් වෙනස් වෙමින් පවතින බව පෙනේ. එම නිසා කාන්තාව සාම්ප්‍රදායික රැකියා වලින් වලින් මිදී ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන විවිධ රැකියා වල යෙදෙන අයුරු වර්තමානයේ දැක ගත හැකිය. මෙම තත්ත්වය සෑම ජාතියකම කාන්තාවන් සඳහා පොදු කරුණක් බව වර්තමාන ශ්‍රම බලකායේ සංයුතිය විමර්ශනයේ දී පෙනී යයි. අප රටේ සංවර්ධනය සඳහා මෙම තත්ත්වය ධනාත්මකව බලපානු ඇතයි විශ්වාස කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. Kottawatta, KHH. (2010). Women Education, Employment and issues of employment in Sri Lanka, Sama Sangrahaya, Department of Sociology and Anthropology, University of Sri Jayewardenepura.
2. Sri Lanka department of census and statistics, 2002.
3. Women and goverínce Sri Lanka, 2003
4. Sri Lanka NEP 2003
5. Quality labour force survey, 2007
6. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව. (2008).
7. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව. (2007).